සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

පිටුව	ප්‍රශ්න අංකය	ලකුණු
1	1 - 10	
2	11 - 21	
3	22 - 30	
4	31 - 40	
5	41 - 45	
6	46	
7	47	
8	48	
එකතුව		
උත්තර පත්‍ර පරීක්ෂක		
ලකුණු පරීක්ෂා කළේ		

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට
බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)

(01) භාෂා හැකියාව (සිංහල)

පැ දෙකයි මිනිත්තු තිහයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු සැපයීම සඳහා සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, අමතර කඩදාසි ලබාගන්න.

විභාග අංකය : .....

- අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද අතුරින් එක් පදයක පමණක් අක්ෂර වින්‍යාසය වැරදි ය. එම පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **කිත් ඉර මත** ලියන්න.

1. (1) උච්චාරණ (2) අත්‍යුත්කෘෂ්ඨ (3) කුණාටු (4) කුටුම්බ (.....)
2. (1) කළමණාකරණ (2) උල්ලංඝන (3) කුම්භස්ථල (4) කෘත්‍යාධිකාරී (.....)
3. (1) ගුරුමුෂ්ටි (2) ඝ්‍රාණේන්ද්‍රිය (3) ඡත්තග්ගාහක (4) ගන්දබ්බ (.....)
4. (1) ථූපවංස (2) තූෂ්ණීම්භූත (3) ජනශ්‍රුති (4) ත්‍රිකෝණ (.....)
5. (1) දාරුණ්‍ය (2) දෘශ්‍යමාන (3) ද්වන්ද්ව (4) නිඝණ්ටු (.....)

(ලකුණු 01 × 5 = 05 යි)

- අංක **6** සිට **8** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද හතර අකාරාදි පිළිවෙළට සකස් කළ විට පිහිටන නිවැරදි අනුපිළිවෙළ තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **කිත් ඉර මත** ලියන්න.

6. අ – ශෞර්ය ආ – ශ්‍රාන්ත ඉ – ශ්වේතච්ඡත්‍ර ඊ – ශ්‍රෝත්‍රේන්ද්‍රිය
   (1) අ, ආ, ඊ, ඉ (2) ආ, ඊ, ඉ, අ (3) ඊ, ඉ, ආ, අ (4) ආ, අ, ඉ, ඊ (.....)
7. අ – ක්ලාන්ත ආ – ක්ෂීරපායී ඉ – ක්‍රූර ඊ – ක්ෂණික
   (1) අ, ආ, ඊ, ඉ (2) ආ, ඉ, ඊ, අ (3) ඉ, අ, ඊ, ආ (4) ආ, ඊ, ඉ, අ (.....)
8. අ – චිරරාත්‍රඥ ආ – චිරස්ථිතිය ඉ – චිත්‍රණය ඊ – චිරාගත
   (1) ආ, අ, ඉ, ඊ (2) ඉ, අ, ආ, ඊ (3) ඊ, ඉ, ආ, අ (4) අ, ඉ, ආ, ඊ (.....)

(ලකුණු 01 × 3 = 03 යි)

- අංක **9** සහ **10** යන එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද හතර අතුරින් නිවැරදිව විසන්ධි කර දක්වා නොමැති පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **කිත් ඉර මත** ලියන්න.

9. (1) ගම්පළ = ගඟ + පළ (2) ගිනියම් = ගිනි + කම්
   (3) පන්තිස් = පන් + තිස් (4) නිරවුල් = නි + අවුල් (.....)
10. (1) මුනීන්ද්‍ර = මුනි + ඉන්ද්‍ර (2) ගුරූපදේශ = ගුරු + උපදේශ
    (3) වාග්ධාරා = වාක් + ධාරා (4) තද්භව = තද් + භව (.....)

(ලකුණු 01 × 2 = 02 යි)

[2 වැනි පිටුව බලන්න.

Past Papers Wiki

● අංක **11** සහ **12** යන එක් එක් ප්‍රශ්නයේ මුලින් දැක්වෙන පදයට සමානාර්ථවත් නොවන පදයක් ඇතුළත් පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **කිත් ඉර මත** ලියන්න.

11. (1) **වෘද්ධ** : මහලු, නාකි, තලතුනා, බුඩිඅ (2) **මාර්ග** : පාර, වීදි, මාවත, වේ
(3) **අග්නි** : අනල, දල, හුතැස්, ගිනි (4) **ඝර** : අගාර, මන්දිර, විමාන, නිවහන (.....)

12. (1) **වාරි** : ජල, උදක, සලිල, කලල්
(2) **නැබල** : උළාර, තුමුල, විසල්, මහත්
(3) **මොළොක්** : මෘදු, ස්නිග්ධ, කෝමල, සියුමැලි
(4) **සතත** : නිරන්තර, නිබඳ, අනුබඳ, නිරතුරු (.....)

(ලකුණු 01 × 2 = 02 යි)

● අංක **13** සිට **22** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **කිත් ඉර මත** ලියන්න.

13. අකාරාදි අනුපිළිවෙළට නිවැරදිව දැක්වෙන වචන කාණ්ඩය කුමක් ද?
(1) ජ්‍යොතිෂ, ඥානාන්විත, ජ්වලන, ජ්‍යෙෂ්ඨ
(2) තාණ්ඩව, තාක්ෂණ, තාම්‍රපර්ණි, තාරුණ්‍යය
(3) දර්පණ, දර්පිත, දර්ශක, දර්ශන
(4) නිශ්චිත, නිශ්ශබ්ද, නිෂ්ඨා, නිෂ්ක්‍රිය (.....)

14. අකුරු ගළපන ලද කල්හි අර්ථවත් වචනයක් සෑදිය හැක්කේ මින් කවරකින් ද?
(1) යසවිරජනී (2) උග්‍රපස්යථ (3) නත්‍රැස්ථාපමා (4) ජනපහවල (.....)

15. අන්‍යොන්‍ය වශයෙන් ගැළපෙන සමාස පද පමණක් ඇතුළත් වචන කාණ්ඩය කුමක් ද?
(1) රන්කඟ, ගත්කරු, කිරිබත්, ඇඟිබැම
(2) අවියත්, උපලේකම්, සම්බාධක, සහසැස්
(3) මව්පිය, කාර්බස්, කැවුම් කොකිස්, කහකුරුලු
(4) දිනකර, අවරගිර, සුරගුරු, සොරබිය (.....)

16. තද්ධිත නොවන පදයක් ඇතුළත් වචන කාණ්ඩය කුමක් ද?
(1) කනිෂ්ඨ, ධර්මිෂ්ඨ, සෞන්දර්ය, ස්වාභාවික (2) දියණියෝ, දිරිමත්, කරටි, සාමර්ථ්‍යය
(3) දැහැමි, දාරුමය, පොඩිති, පිහාටු (4) දියබ, දනතා, තොටි, රූමත් (.....)

17. කෘදන්ත නොවන පදයක් ඇතුළත් වචන කාණ්ඩය කුමක් ද?
(1) කියමන්, උයමන්, ලියමන්, යෝජිත (2) කැලුම්, හැඬුම්, රැකුම්, බැණුම්
(3) කළ, නටන, හරිනු, උතුළ (4) විසුළ, අතුළ, පතළ, නැටිලි (.....)

18. උපසර්ග නොවන පදයක් ඇතුළත් වන්නේ මින් කවරක ද?
(1) පර, දු, අබි, පිරි (2) උප, පිළි, වි, කු
(3) අනු, අව, අප, අ (4) අති, නි, අධි, නො (.....)

19. අන්‍යොන්‍ය වශයෙන් **නොගැළපෙන** පදයක් ඇතුළත් වචන කාණ්ඩය කුමක් ද?
(1) පෑන්, පැන්සල්, පන්හිඳ, පින්සල (2) පුටු, මේස, ඇඳන්, බංකු
(3) සෙම්, සොටු, කෙළ, ලේ (4) කුමුදු, මානෙල්, නෙලුම්, ඕලු (.....)

20. මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථවත් පදයක් ඇතුළත් වන්නේ මින් කවරක ද?
(1) **බුද්ධිපූර්ණ** : ප්‍රාඥ, විදග්ධ, පණ්ඩිත, ඥානවෘද්ධ
(2) **මර්යාදා** : ආසන්න, සමීප, ළඟ, අදූර
(3) **සංවෘත** : ආවෘත, අප්‍රකට, විවෘත, ආකුල
(4) **මාගම** : අඟන, මහිලා, කත, යොනන් (.....)

21. ක්‍රියාපද වර්ගයට ඇතුළත් නොවන පදයක් සහිත පද පෙළිය මින් කුමක් ද?
(1) විකුට, කොට, වපුට, අතුට (2) නටමින්, හිඳිමින්, දුව දුව, වසමින
(3) කරත, පිහිනත, වඩිද්දි, කියත (4) දොඩනුව, බලන්ට, සොයනුව, ගිය (.....)

[3 වන පිටුව බලන්න.

22. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ර අක්ෂරයෙන් පසුව යංශය නොයෙදේ.
(2) රේඵය උච්චාරණය කෙරෙන්නේ ව්‍යංජනයකට පසුවයි.
(3) ව්‍යංජනයකට පසුව ද බිංදුව යෙදේ.
(4) සෑම අනුනාසිකාක්ෂරයක්ම ද්විත්ව කළ හැකි ය. (.....)

(ලකුණු 01 × 10 = 10 යි)

- අංක **23** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වාක්‍යාංශයෙහි නිවැරදි අරුත දෙන තනි යෙදුම තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

23. සැමියා හෝ භාර්යාව හෝ දෙදෙනාගෙන් එක් අයෙකු තාවකාලිකව ඇත්ව විසීම
(1) වියෝගය (2) විප්‍රයෝගය (3) ප්‍රවාසය (4) විරහව (.....)

24. කිසියම් කෙනෙකුට හෝ පිරිසකට හෝ පැවරූ කාර්යයක් මනාව සිදුවන්නේ දැයි සොයා බැලීම
(1) අධීක්ෂණය (2) සමීක්ෂණය (3) නිරීක්ෂණය (4) ගවේෂණය (.....)

25. රටක් ආක්‍රමණයට පැමිණි හතුරන් වළක්වාලීම
(1) ප්‍රතිමර්දනය (2) ඝාතනය (3) ප්‍රතිබාහනය (4) නාශනය (.....)

(ලකුණු 01 × 3 = 03 යි)

- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රකාශයට වඩාත් හොඳින් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

26. නිෂ්ඵල කාර්යයක යෙදීම
(1) අඟින් කිරි දෙවීම (2) අටුව කඩා පුටුව සෑදීම
(3) අටුවෙන් දුමට පැනීම (4) අතු කඩා මොර කෑම (.....)

27. මිතුරුකම් පෙන්නා සතුරුකම් කිරීම
(1) හිස අත ගා ඇහැ ඉලිප්පීම (2) අත දීලා දත නියවීම
(3) අඟේ ඉඳන් කණ කෑම (4) ඇමක් දී මාළුවෙකු අල්ලා ගැනීම (.....)

28. දුෂ්කර කාර්යයක යෙදීම
(1) කුරුල්ලන්ට වැට බැඳීම (2) කණා ගල් ගැසීම
(3) කණා පල්ලම් බැසීම (4) කණමැදිරි එළියෙන් නිදන් සෙවීම (.....)

(ලකුණු 01 × 3 = 03 යි)

- අංක **29** සහ **30** යන එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද පේළි අතුරින් යුගල පදයක් ඇතුළත් **නොවන** පද පේළිය තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

29. (1) උකුළු මුකුළු, උදවු පදවු, ඉවක් බවක්, එතන මෙතන
(2) කල් යල්, කැරලි කෝලාහල, අකා මකා, ඇණුම් බැණුම්
(3) නහින දෙහින, ගසා බසා, ගුටි බැට, හෙළන නගන
(4) කීර්ති ප්‍රශංසා, කුල මල, කොටිට මෙට්ට, වට්ටි පෙට්ටි (.....)

30. (1) වෙද හෙදකම්, සිරිත් විරිත්, සුන් බුන්, හොර බොරු
(2) හිතා මතා, රොස් පරොස්, හර බර, විදෙන ලෙලෙන
(3) මැහුම් ගෙතුම්, ගල් මුල්, ගොඩ මඩ, හබල් බබල්
(4) කොල්ලො කුරුට්ටො, කල දසාව, අනම් මනම්, ඉවුම් පිහුම් (.....)

(ලකුණු 01 × 2 = 02 යි)

● අංක **31** සහ **32** යන එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

31. (1) අප රජයේ සේවකයන් වෙමු. (2) අප රජයේ සේවකයෝ වෙමු.
(3) අපි රජයේ සේවකයන් වෙමු. (4) අපි රජයේ සේවකයෝ වෙමු. (.....)

32. (1) ඔවුන් දරුවෝ කැටුව ගෙදර පැමිණ ඇත. (2) ඔවුහු දරුවන් කැටුව ගෙදර පැමිණ ඇත.
(3) ඔවුන් දරුවන් කැටුව ගෙදර පැමිණ ඇත. (4) ඔවුහු දරුවෝ කැටුව ගෙදර පැමිණ ඇත. (.....)

(ලකුණු 01 × 2 = 02 යි)

● අංක **33** සිට **40** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන පාඨයේ ඇතුළත් තොරතුරු මත පදනම් වේ.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා සැපයීමේ දී පෞද්ගලික අංශය අඛණ්ඩව ප්‍රධාන භූමිකාවක් නිරූපණය කළේ ය. 2015 වසර අවසානය වන විට පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කොමිසම යටතේ ලියාපදිංචි වූ ඇඳන් 5883 කින් සමන්විත පෞද්ගලික රෝහල් 241 ක් පැවතුණි. ඇඳන් 287 කින් සමන්විත පෞද්ගලික ආයුර්වේද රෝහල් 20 ක් ද මෙයට ඇතුළත් විය. ආදායම් මට්ටම ඉහළ යෑම, ජීවන රටා වෙනස්වීම සහ වඩා සුවපහසු වාතාවරණයක් තුළ සෞඛ්‍ය සේවා ලබා ගැනීමට වැඩි කැමැත්තක් දැක්වීම යන කරුණු හේතු කොටගෙන පෞද්ගලික සෞඛ්‍ය සේවා සඳහා වන ඉල්ලුම ඉහළ ගොස් ඇත. විශේෂඥ වෛද්‍යවරුන් වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වීම මෙන්ම නවීන පහසුකම් හා උපකරණවලින් යුතු නූතන තාක්ෂණය භාවිතය ද පෞද්ගලික සෞඛ්‍ය සේවාවන්ගේ ජනප්‍රියතාව ඉහළ යෑමට හේතු වී ඇත. පෞද්ගලික ආයුර්වේද රෝහල් හා බෙහෙත් ශාලා සංඛ්‍යාව 2014 වසරේ දී පැවැති 10 හා 35 සිට 2015 වසරේ දී පිළිවෙළින් 20 හා 110 දක්වා තියුණු ලෙස ඉහළ යෑම මගින් පිළිබිඹු වන පරිදි දේශීය චිකිත්සා මෙන්ම ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති වෛද්‍ය ක්‍රම සමග සම්බන්ධ වූ දේශීය සෞඛ්‍ය සේවා සැපයීමේ දී පෞද්ගලික අංශයේ සහභාගිත්වය කැපී පෙනේ. පෞද්ගලික සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ දැකිය හැකි වූ විශිෂ්ට වර්ධනය හා සංචාරක කර්මාන්තයේ ඇති වෙමින් පවතින සැලකිය යුතු වැඩිදියුණුවීම් මගින් ශ්‍රී ලංකාවට හොඳම හා විවිධ වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන ගෝලීය සෞඛ්‍ය ගමනාන්තයක් බවට පත්වීම සඳහා වෛද්‍ය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට අවස්ථාවක් සලසා දෙයි. සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කරන අතර, පිළිගත් සම්මතයන්ට අනුකූලව මෙම සේවාවන් නියාමනය කිරීම හා ප්‍රතීතනය කිරීම මගින් සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු වන බව සහතික කිරීම සඳහා පියවර ගැනීම ද අත්‍යවශ්‍ය වේ.

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රකාශය නිවැරදි වන්නේ නම් "ඔව්" යන්න ද වැරදි වන්නේ නම් "නැත" යන්න ද පමණක් ඉතිරි කොට **අනෙක් වචනය තනි ඉරකින් කපා** දක්වන්න.

33. පෞද්ගලික රෝහල්වල පවත්නා නවීන පහසුකම් හා උපකරණවලින් යුතු නූතන තාක්ෂණය භාවිතය රජයේ රෝහල්වල පවා නොමැති බව මෙම ලේඛකයාගේ අදහසයි. (ඔව් / නැත)

34. මෙම පාඨයේ අරමුණ වනුයේ සෞඛ්‍ය සේවා සැපයීමේ දී පෞද්ගලික අංශයේ දායකත්වය හෙළි කිරීමයි. (ඔව් / නැත)

35. පිළිගත් සම්මතයන්ට අනුකූලව සෞඛ්‍ය සේවාවන්ගේ නියාමනය හා ප්‍රතීතනයත් සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු වීමත් අතර ඇත්තේ හේතුඵල සම්බන්ධයකි. (ඔව් / නැත)

36. වෛද්‍ය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කළ හොත් ශ්‍රී ලංකාව ගෝලීය සෞඛ්‍ය ගමනාන්තයක් බවට පත් වේ. (ඔව් / නැත)

37. සිද්ධ, යුනානි හා හෝමියෝපති වෛද්‍ය ක්‍රම සම්බන්ධවන්නේ දේශීය සෞඛ්‍ය සේවා සමගයි. (ඔව් / නැත)

38. රෝහල් හිමියන් විසින් රෝගීන් සඳහා විශේෂඥ වෛද්‍යවරුන් වෙත පහසුවෙන් ප්‍රවේශවීමට හැකියාව ලබාදීම පෞද්ගලික සෞඛ්‍ය සේවාවන්ගේ ජනප්‍රියතාව පවත්වා ගැනීමට යෙදූ එකම උපක්‍රමයයි. (ඔව් / නැත)

39. පෞද්ගලික සෞඛ්‍ය සේවා සඳහා වන ඉල්ලුම ඉහළයාමට හේතු වූයේ පොදු මහජනතාවගේ ආදායම් මට්ටම ඉහළ යාම හා ජීවන රටා වෙනස්වීම යන කරුණු දෙකයි. (ඔව් / නැත)

40. 2015 වසර අවසානය වන විට පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කොමිසම යටතේ ලියාපදිංචි මුළු පෞද්ගලික රෝහල් සංඛ්‍යාව 261 ක් විය. (ඔව් / නැත)

(ලකුණු 01 × 8 = 08 යි)

[5 වන පිටුව බලන්න.

- අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති කෙටි වාක්‍ය තුන අර්ථවත් අදහසක් ප්‍රකාශවන සේ **තනි වාක්‍යයක් සේ** ගළපා දෙන ලද **තිත් ඉරි මත** ලියන්න.

41. නිදන්ගත වකුගඩු රෝගයට ඇත්තේ අවිනිශ්චිත සම්භවයකි. මෙම රෝගය දිස්ත්‍රික්ක දහයක පැතිර ඇත. එසේම එය බරපතල සෞඛ්‍ය ගැටලුවක් බවට පත් වී තිබේ.

.....

.....

.....

42. වකුගඩු රෝගය ඇතිවීමට බල පෑ හේතු ගණනාවක් වේ. කෘෂි රසායන අධික ලෙස භාවිතය ඉන් එකකි. කිවුල් ජලය භාවිතය හා ප්‍රමාණවත් ලෙස ජලය පානය නොකිරීම අනෙක් කරුණු අතර වේ.

.....

.....

.....

43. මෙරට තුළ පවත්නා සියලු අධ්‍යාපන මට්ටම් ත්‍රිවිධාකාර වේ. එනම් ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික වශයෙනි. මෙම සියලු අධ්‍යාපන මට්ටම්වල අඛණ්ඩ වර්ධනයක් අත්‍යවශ්‍ය වේ.

.....

.....

.....

44. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රධාන ගැටලු කිහිපයක් වේ. කර්මාන්ත සඳහා අවශ්‍ය කරන කුසලතා සහ සිසුන්ගේ කුසලතා අතර පවත්නා පරතරය ඉන් එක් ගැටලුවකි. අනෙක් ගැටලුව නම්, සාමාන්‍ය අධ්‍යාපනය තුළ ප්‍රාදේශීය වශයෙන් පවත්නා විෂමතා ය.

.....

.....

.....

45. ජංගම දුරකථනයක් සතුකර ගැනීමේ ලාභදායීම රට ශ්‍රී ලංකාවයි. අන්තර්ජාල බ්‍රෝඩ්බෑන්ඩ් මිල ගණන් සම්බන්ධයෙන් ද ලාභදායී රටවල් අතරට ශ්‍රී ලංකාව ඇතුළත් වේ. 2015 ජාත්‍යන්තර විදුලි සංගමයේ වාර්තාවෙහි මෙම තොරතුරු ඇතුළත් වේ.

.....

.....

.....

(ලකුණු 02 × 5 = 10 යි)

46. පහත දැක්වෙන පාඨයේ වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** පමණ වන සේ සාරාංශ කොට ලියා යෝග්‍ය **මාතෘකාවක්** ද යොදන්න. සාරාංශය අවසානයේ ඔබ යෙදූ **වචන සංඛ්‍යාව** ලියා දක්වන්න.

මෙරට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා භාවිතය පුළුල් කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ක්‍රියාකාරී ලෙස දායක විය. නොමිලේ වයිෆයි සේවා ලබා දීම ඇරඹීම යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ප්‍රධාන බස් නැවතුම්පොළ, පොදු වෙළෙඳ මධ්‍යස්ථාන, දුම්රිය ස්ථාන, මහජන පුස්තකාල, රාජ්‍ය ආයතන, රෝහල්, විශ්වවිද්‍යාල හා අනෙකුත් පොදු ස්ථානවල නොමිලේ අන්තර්ජාල සේවා සපයමින් වයිෆයි ස්ථාන 200 කට වැඩි ප්‍රමාණයක් නිම කළ අතර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා වෙත ප්‍රවේශ වීමට ග්‍රාමීය ජනතාවට වැඩි අවස්ථා සලසා දෙමින් රට තුළ නැණසල මධ්‍යස්ථාන 1005 ක් ක්‍රියාත්මක කරන ලදී. තවද, රාජ්‍ය ආයතනවල වෙබ් අඩවි නිර්මාණය කිරීමේ කටයුතුවල තොරතුරු හා තාක්ෂණ නියෝජිතායතනය අඛණ්ඩව නිරත වූ අතර, ඉ-පළාත් පාලන ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන තුනක් සඳහා නියමු වෙබ් අඩවි ක්‍රියාත්මක කරන ලදී. මාර්ගගත පොලිස් නිශ්කාෂණ සහතිකපත් නිකුත් කිරීමේ සේවාව, වාහන තොරතුරු සොයා බැලීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ජංගම යෙදවුමක් නිර්මාණය කිරීම, මාර්ගගත ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව, නැගෙනහිර, වයඹ, සබරගමුව හා මධ්‍යම පළාත් වෙත

Past Papers Wiki

පුළුල් කිරීම වැනි රාජ්‍ය ඉ-සේවා කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, සයිබර් අපරාධ විමර්ශනය සඳහා පහසුකම් සලසන සයිබර් අපරාධ පිළිබඳ බුඩාපෙස්ට් සම්මුතියට ඇතුළත් වූ ප්‍රථම දකුණු ආසියානු රට හා දෙවන ආසියානු රට බවට ශ්‍රී ලංකාව පත් විය.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

(ලකුණු 15 යි)

47. "ඇහැටුගම" ප්‍රදේශයේ බිම්කොටසක් මිල දී ගත් ව්‍යාපාරිකයෝ පිරිසක් නගරබද පළාත්වල පිහිටි ඔවුන්ගේ ව්‍යාපාරික ස්ථානවලින් ඉවත්කරන කුණු කසළ එම බිම් කොටසට බැහැරකරලීමේ කාර්යයේ නියැලී සිටිති. මේ හේතුවෙන් අවට පැතිරෙන ඉවසිය නොහැකි දුර්ගන්ධයට අමතරව මැස්සන්ගෙන් ද ප්‍රදේශවාසී ජනතාවට ගැහැට පැමිණේ. "ඇහැටුගම" පරිසරය සුරැකීමේ සංවිධානයේ ලේකම් ඔබයැයි සිතා මෙම ගැටලුව නිසා ප්‍රදේශවාසී ජනතාවට මුහුණ දීමට සිදු වී ඇති විවිධ දුෂ්කරතා විස්තරාත්මකව දක්වමින්, මේ ආකාරයට එම බිම්කොටසට කුණු කසළ බැහැරකරලීම වැළැක්වීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් ප්‍රාදේශීය ලේකම් තුමාට යැවීම සඳහා සුදුසු ලිපියක් ලියන්න. (ලිපියේ වචන සංඛ්‍යාව **150** ට වඩා නොවැඩි විය යුතු ය)

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

[7 වන පිටුව බලන්න.

Past Papers Wiki

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

(ලකුණු 15 යි)

48. පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරා ගෙන වචන **250** කට නොවැඩි වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

(i) මෙරට ජනවර්ග අතර සුහදතාව ගොඩනැංවීමේ උපායමාර්ග

(ii) අදහස් පළකිරීමේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදී රටක වැදගත් ලක්ෂණයකි

(iii) ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ යෝග්‍යතාව හා එමගින් සැලසෙන යහපත

(iv) සාම්ප්‍රදායික සාරධර්ම සුරැකීම හා පිළිපැදීම සමාජයේ යහ පැවැත්මට උපකාරීවේ

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

PAST PAPERS WIKI

[8 වන පිටුව බලන්න.

(ලකුණු 20 යි)

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library